දියානා සොල්

This Story
Really Happened

Muthumudalige Nissanka

දියානා සොෆ්

ප්‍රථම මුද්‍රණය : 2026 පෙබරවාරි

ISBN 978-624-5552-29-0

2026 @මුතුමුදලිගේ නිශ්ශංක

මුද්‍රණය

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්

නො 27/18 ජයන්ත වීරසේකර මාවත

කොළඹ 10

සෝදුපත් පරීක්ෂාව

අශෝක කුලතුංග

කවර නිර්මාණය

කලණ ගංගනාත්

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි. කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට: අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම, ඊ -බුක්, පිඩීඑෆ් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.

සියලුම හිමිකම් ඇවිරිණි. මුතුමුදලිගේ නිශ්ශංක 2026

This book is dedicated to My Dear Friend,

Mashi Hemapala,

For Your Kindness, Support,

and the Beautiful Friendship We Share.

02.30

මේ හැම දේම සිද්ධ වෙන්න ගත්තේ මීට දවස් තුනකට කලින්...

සිකුරාදා.

හරියට ම රෑ දෙකයි තිහට.

ඔව්...

රෑ දෙකයි තිහට මාව එකපාර ම ඇහැරුණා. මාව ඇහැරුණ හැටිය ම මගේ ඇස් ගියේ කොරිඩෝව පැත්තකින් තියෙන ඔෆිස් කාමරයට. අපේ නිදන කාමරය ඉස්සරහ ම තියෙන්නේ පොඩි කොරිඩෝව. ඒක පැත්තකින් තමයි ඔෆිස් කාමරය තියෙන්නේ.

මම දැක්කා කවුරු හරි ඇවිදගෙන ඔෆිස් කාමරයට යනවා. කොරිඩෝව අන්ධකාරයි. එහෙත් අපේ කාමරයේ නිදන ලාම්පුව දල්වලා තියෙන නිසා කොරිඩෝව යාන්තමට වගේ පේනවා. මම මුලින් ම හිතුවේ ඒ ගියේ ඊඩන් කියලා. ඒ නිසා මම අනිත් පැත්ත හැරිලා ඊඩන් දිහා බැලුවා.

නෑ... ඊඩන් නිදි.

අපි දෙන්නා හැරෙන්න වෙන කවුරුත් ගෙදර නෑ. අනික ඒක ඊඩන්ගේ ඔෆිස් කාමරය නෙමෙයි. මගේ එක. ඊඩන්ගේ කාමරේ තියෙන්නේ බිම් මහලේ. මම නැඟිට්ටා. ඇඳෙන් පහතට කකුල් දෙක තියලා කොරිඩෝව දිහා ටික වෙලාවක් බලාගෙන හිටියා.

'නෑ... ඒ කවුරුවත් වෙන්න බැහැ'

ඒක නිකන් ම නිකන් හිතලුවක් වෙන්න ඇති. ඒත්... එහෙමත් වෙන්න බැහැ. මම ඒක දැක්කා... කවුරු හරි ඇවිදගෙන ඔෆිස් කාමරයට ගියා.

මම හිටගත්තා. නයිටියත් ඇඟට තද කරගෙන කොරිඩෝව දිගේ ඇවිදගෙන ඔෆිස් කාමරයට ගියා. ඔෆිස් කාමරයේ දොර ඇරිලා. කොහොමත් මම කාමරයේ නැති වෙලාවට කාමරයේ දොර ඇරලා තියන්නේ. කාමරය අන්ධකාරයි. මම බිත්තියේ පැත්තකින් තියෙන සුවිචයට අත දාලා බල්බය පත්තු කළා.

නැහැ... කාමරයේ කවුරුවත් නැහැ. කාමරයේ ඉදිරියෙන් ම තියෙන්නේ මගේ මේසය. මේසයට එහා පැත්තේ පුටුව. පැත්තකින් පොත් රාක්කය. මේක ඒ තරම් ලොකු කාමරයකුත් නෙමෙයි පොඩි එකක්.

'හිතලුවක්'

මම ඔළුවත් කසාගෙන බල්බයත් නිවලා ආයෙත් අනිත් පැත්ත හැරුණා. ඒ හැරෙද්දි මම දැක්කා... මේසයට එහා පැත්තේ තියෙන මගේ පුටුවේ කවුරු හරි ඉඳගෙන ඉන්නවා. මගේ ඇඟ සීතල වෙලා ගියා. ඒක දකිද්දි ආපු බයට ම මම කෑ ගැහුවා.

"ඊඩන්...."

ඒ බයත් එක්ක ම මාව එතැන ම කොරිඩෝවට ඇදගෙන වැටෙන්න ඇති.

"ඇයි මොකද?"

ඊඩන් මගේ ළඟට දුවගෙන ආවා.

"ඔෆිස් කාමරේ කවුරු හරි ඉන්නවා"

මම එතැන බිම ඉඳගෙන ම එයාට කෑගහලා කිව්වා.

මට ආයෙමත් ඔෆිස් කාමරය දිහා බලන්න තරම් ශක්තියක් තිබුණේ නැහැ.

ඒ නිසා මම කළේ ඊඩන් කාමරයට ඇතුල් වෙද්දි අහක බලාගෙන හිටි එක.

"කෝ කවුද?"

ඊඩන් ඔෆිස් කාමරයේ බල්බය පත්තු කළා.

"කෝ... මෙලින්ඩා... කවුද?"

එයා ආයෙමත් ඇහුවා.

මම යාන්තමින් ඇස් හරවලා ඔෆිස් කාමරය දිහා බැලුවා.

"අර පුටුව..."

"ඇයි... මොකක්ද පුටුව?"

"ඒ පුටුවේ කවුරු හරි ඉඳගෙන හිටියා ඊඩන්"

"කෝ කවුරුත් නැහැනේ"

ඊඩන් කාමරයේ හැම පැත්ත ම හොඳින් බලමින් කාමරය ඇතුළට ගියා. මමත් වැටිලා හිටිය තැනින් හිටගත්තා. ඒ පුටුව දිහා බැලුවා.

එතැන කවුරුත් නැහැ. මම ඊඩන් ළඟට ම ගිහින් එයාගේ අතින්

අල්ලගෙන එයාට වාරුවෙලා හිටගත්තා.

"ලයිට් එක ඕෆ් කරන්නකෝ"

"ඇයි?"

"ඕෆ් කරන්නකෝ"

මම හිතුවේ මම ඒක ආයෙමත් දකියි කියලා.

ඊඩන් බල්බය නිවලා දැම්මා.

නැහැ, කවුරුත් නැහැ. කලින් අන්ධකාරයේ දැකපු ඒ රූපේ එතැන නැහැ.

"මෙලී ඔයා බොරුවට බය වෙලා. මෙතැන ඇති දෙයක් නැහැ. ඔයා නිදාගන්න කලින් මොකක් හරි විකාර පොතක් කියවන්න ඇති. ඔය පොත්වල තියෙන ඒවා තමයි ඔයාගේ පස්සෙන් එන්නේ"

එතකොට තමයි මම දැක්කේ ඒ චිත්‍රය. ඒක පොළොවෙ වැටිලා තියෙනවා. ඊඩන් ගිහින් ඒ චිත්‍රය අහුලලා අතට ගත්තා.

"මේ චිත්‍රය බිම වැටිලා"

එයා එහෙම කියලා චිත්‍ර කොළේ දිහාත් යාන්තමින් බලලා ඒක ආයෙමත් මේසේ උඩ තිබුණ අනිත් චිත්‍ර උඩින් ම තිබ්බා.

(එදා තමයි මම මගේ පංතියේ ළමයින්ට චිත්‍ර අඳින්න දුන්නේ. ඒ නිසා ඒ ළමයි ඇඳපු චිත්‍ර කොළ මම අරගෙන ඇවිත් මේසය උඩින් තිබ්බා නිවාඩු වෙලාවක බලලා ලකුණු දෙන්න.)

චිත්‍ර කොළේ මේසය උඩින් තියලා ඊඩන් මාවත් තුරුලු කරගෙන බල්බයත් නිවලා දාලා, කොරිඩෝව දිගේ ම අපේ නිදන කාමරයට ආවා.

ඒ තමයි පළවෙනි දවස.

එදා සිකුරාදා. ඊට පහුවෙනිදා... මමයි, ඊඩනුයි ෆමින්ග්ටන්වලට ගියා අපේ අම්මලව බලන්න. අපි දෙන්නා අලුත විවාහ වුණු නිසා පුරුද්දක් විදියට විවාහ වුණු දවසේ ඉඳන් ම අපි හැම සෙනසුරාද ම මගේ අම්මගේ ගෙදරත්, හැම ඉරිදා ම ඊඩන්ගේ අම්මගේ ගෙදරටත් යනවා. අපිට හිටියේ අම්මලා දෙන්න ම විතරයි. ඒ නිසා ඒක පුරුද්දක් විදියට අපි හැම සති අන්තෙ ම කළා. අනික ඒ අය ඉන්නේ වැඩි දුරක නෙමෙයි. අපේ ගෙවල් ළඟ ඉඳන් කිලෝ මීටර් දෙක තුනක් ඇතින්.

එදා අපි ආයෙත් ගෙදර ආවේ රෑ වෙලා. ඒ ඇවිත් රාත්‍රී ආහාරත් අරගෙන අපි දෙන්න ම නින්දට ගියා. මම හිතුවේ එදාවත් අපිට හොඳින් නිදාගන්න පුළුවන් වෙයි කියලා. අම්මත් එක්ක මුළු දවස ම ගත කරපු නිසා මගේ ඔළුවත් පුදුමාකාර විදියට නිදහස් වෙලා තිබ්බේ. ඒ නිසා ම ඇඳට වැටුණ හැටියෙ ම මට හොඳට නින්ද ගියා.

මාව ආයෙමත් ඇහැරුණේ මට මොකක් ම හරි දෙයක් දැනුණ නිසා. හරියට කවුරු හරි මගේ ළඟින් ඇවිදිනවා වගේ. මම ඇස් දෙක ඇරිය හැටිය ම කොරිඩෝව දිහා බැලුවා.

ඒ ඡායාව... ඔව්... මම ඒක ආයෙමත් දැක්කා. එයා ඇවිදගෙන ඔෆිස් කාමරයට ගියා. මගේ පපුව සීතල වුණා. මගේ මුළු ශරීරය ම ගලක් වගේ ගල් වුණා. මගේ ඇස් ඉබේ ම වගේ ඔරලෝසුව දිහාවට හැරුණා. වෙලාව දෙකයි තිහයි.

"ඊඩන්... ඊඩන්"

මම කෙඳිරුවා. එයා නිදි... ඒත්... මට මේක දරාගන්න බැහැ. මගේ පපුව රිදෙනවා.

"ඊඩන්... නැඟිටින්න"

මම ඊඩන්වත් නැඟිට්ටවන ගමන් ඇඳේ ඉඳගත්තා.

"ඇයි... මොකද?"

"කවුද කොරිඩෝව දිගේ ඔෆිස් කාමරයට ගියා..."

"මොකක්... ඔයාට විකාර ද?"

"නැහැ විකාර නෙමෙයි... මම දැක්කා"

"මොන පිස්සුවක් ද"

ඊඩන් නැඟිටලා කොරිඩෝව දිහා බැලුවා. කොරිඩෝව අඳුරුයි.

"කෝ කවුරුත් නැහැනේ"

"කොරිඩෝවේ නෙමෙයි... ඔෆිස් කාමරේ... මම දැක්කා යනවා, මේ මගේ පපුව තවමත් ගැහෙනවා"

මම හිමිහිට කොඳුරන ගමන් එයාගේ අතක් අරගෙන මගේ පපුවට තිබ්බා.

"ඔව්... ඔයාව ගැහෙනවා"

එයා එහෙම කියලා ඇඳෙන් නැඟිට්ටා. නැඟිටලා මගේ අතිනුත් අල්ලගෙන කොරිඩෝව දිගේ ඔෆිස් කාමරේට ගියා.

"අනේ ඊඩන්"

එයා ඔෆිස් කාමරයේ බල්බය දල්වද්දි මම එයාගේ පස්සෙ හැංගුණා. හැංගිලා එයාගේ උරහිස උඩින් යාන්තමින් ඔෆිස් කාමරේට එබුණා. ඒත් ඔෆිස් කාමරේ කවුරුත් නැහැ.

"ඊයේ වගේ ම තමයි කවුරුත් නැහැ. පේනවනේ... ඔයා බොරුවට බය වෙලා."

ඊඩන් මගේ ඇස් දෙක දිහා හරි කෙළින් බැලුවා.

"ඇයි ඔයා හැමදාම මේ විදියට බය වෙන්නේ, මොකක්ද ඔයා මේ දවස්වල කියවන පොත?"

"නැහැ එහෙම එකක් නැහැ"

"නැත්තේ කොහේද? ඔයා හැමදාම රෑට නිදාගන්න කලින් පොතක් කියවනවනේ. මේ දවස්වලත් මොකක් හරි විකාරයක් කියවනවා ඇති. මෙලී, පොත්වල තියෙන දේවල් ඔළුවට අරගෙන කියෙවුවා ම ඒවා ඇත්තටම වෙනවා. මගේ යහළුවකුත් ගිය සතියේ මැරුණා පොතක් කියවලා රෑට බය වෙලා. ෆිල්ම්වලට වඩා පොත්වල තියෙන දේවල් ඇත්තටම සිද්ධ වෙනවා"

ඊඩන් බොහෝ ම බැරෑරුම්ව කියලා මගේ මුහුණ දිහා බලාගෙන හිටියා. මම දැකපු ඡායාවටත් වඩා එයා කියපු දේට මගේ පපුව ගැස්සුණා.

ටික වෙලාවක් බැරෑරුම්ව මගේ දිහා බලාගෙන හිටිය ඊඩන් එක පාර ම හිනාවෙන්න ගත්තා.

"ඔයා බය වුණානේ... මෝඩී"

එයා මගේ ඔළුවටත් ටොක්කක් ඇණලා මාව එයාගේ පපුවට තුරුලු කරගත්තා.

"මම විහිළුවක් කළේ. ඔය විකාර ඇත්තටම වෙන්නෑ. ඔයා ඊයේ වගේ ම අදත් මොකක් හරි විකාරයක් කියවලා නිදියගෙන"

එයා එහෙම කියලා මගේ අතින් ඇදගෙන ආයෙමත් කොරිඩෝවට එන්න හැරුණා. එතකොට තමයි මම ඒක දැක්කේ... ඒ චිත්‍රය.

"ඔහොම ඉන්න, චිත්‍රයක් වැටිලා... මේසයෙන් වැටෙන්න ඇති"

මම පහත් වෙලා එතැන මේසය ළඟ වැටිලා තිබුණු චිත්‍රය අතට ගත්තා. ඒක අතට ගනිද්දි ම.... මට මොකක් හරි දෙයක් දැනුණා. ඒක අමුතු... මහ ගුප්ත හැඟීමක්. හරියට මම චිත්‍රය අතට ගනිද්දී කවුරු හරි මගේ පිටිපස්සෙන් උරහිස්වලින් අල්ලනවා වගේ. මම එකපාර ම පිටිපස්ස හැරුණා.

'නැහැ ඒ ඊඩන් නෙමෙයි... ඊඩන් ඉන්නේ දොර ළඟ හිටගෙන.'

මට තවත් එක මොහොතක්වත් එතැන ඉන්න හිත දුන්නෑ. මම චිත්‍රය මේසය උඩ තිබ්බා. ඒත් එක්ක ම මම ඒ චිත්‍රය දිහා බැලුවේ අහම්බෙන්.

"ඊඩන්"

මගේ මුවින් පිටවුණේ කෙඳිරිල්ලක්.

"ඇයි...?"

"මේ චිත්‍රය ම තමයි ඊයෙත් බිම වැටිලා තිබ්බේ"

"මොකක්ද කෝ?"

"මේක"

මම චිත්‍රය ඊඩන්ට දික් කළා.

"ඔව්... ඕක තමයි..."

එයත් ඒක අඳුරගන්න ඇති.

"ඉතින් ළමයෝ ඔය චිත්‍රය නේද උඩින් ම තියෙන්නේ. ඉතින් ඒක ම වැටෙන්න ඇති"

"නැහැ..."

මම මිමිනුවා.

"මේක වැටෙන්න විදියක් නැහැ"

මගේ ඇස් ගියේ මේසයට එහා පැත්තේ තිබුණු පුටුවට. මම ඊයේ දැකපු කෙනා ඉඳගෙන හිටියේ ඒ පුටුවේ. මට තවත් මේ කාමරයේ ඉන්න බැහැ.

"යමු"

මම චිත්‍රය අතට ගත්තා. මට ඕනෙ වුණේ ඒ කාමරෙන් ඉක්මනට එළියට යන්න. චිත්‍රයත් අරගෙන මම ආයෙමත් මගේ කාමරයට ආවා. ඒ ඇවිත් මගේ ටීපෝව උඩ තියෙන නිදන ලාම්පුව පත්තු කරලා චිත්‍රය ලාම්පු එළියට ළං කළා. ඒක මහ අමුතු චිත්‍රයක්. ඒ චිත්‍රයේ උඩින් ම මෙහෙම ලියලා තියෙනවා.

"මගේ පවුල"

මම චිත්‍රය දිහා බලද්දි ඊඩන් පොරෝනයෙන් ඇඟත් වහගෙන නිදාගන්න හැරෙනවා. මම චිත්‍රයත් අතේ තියාගෙන එයා දිහා බැලුවා.

"ඊඩන්"

"ඇයි ඒ පාර මොකද?"

"පොඩ්ඩක් බලන්න මේක"

"මොකක්ද?"

"මේ චිත්‍රය"

මම චිත්‍රය එයාගේ දිහාවට දික් කළා.

එයා චිත්‍රයත් අතට අරගෙන මගේ පැත්ත හැරිලා, ලාම්පු එළියට චිත්‍රය අල්ලලා ඒක දිහා හොඳට බැලුවා.

"මගේ පවුල.... ඉතින්?"

එයා චිත්‍රයේ උඩින් ම තියෙන වාක්‍යයත් කියවන ගමන් යාන්තමින් හිනාවුණා.

"ලස්සනයි... කවුද මේක ඇඳලා තියෙන්නේ... පොඩි එකෙක් ද?"

"ඔව්... මම සිකුරාදා පංතියේ දරුවන්ට කිවුවා චිත්‍රයක් අඳින්න කියලා. මාතෘකාවට දුන්නේ මගේ පවුල"

"හ්ම්... ඒක තමයි. හොඳයි පොඩිකමට ඇඳලා තියෙනවා"

ඊඩන් එහෙම කියලා චිත්‍රය ආයෙමත් මගේ අතේ තිබ්බා. මම එයාගේ මුහුණ දිහා බැලුවේ අමනාපයෙන්.

"ඇයි?"

"ඇයි කියන්නේ ඔයා හරියට බැලුවේ නැහැ"

"මොනවා බලන්න ද ඕක පොඩි එකෙක්ගේ චිත්‍රයක්නේ"

"ඔව්...ඒත් හරියට බලන්නකෝ... මේ"

මම චිත්‍රය ආයෙමත් ඊඩන්ට දික් කළා. එයා ඕනෑවට එපාවට වගේ චිත්‍රය දිහා බැලුවා.

"බලන්නකෝ ඔය ඒ ළමයා ළඟින් ම ඉන්න අනිත් කෙනා. එයාගේ මුහුණ කළුයි, ඇඟත් පාට කරලා තියෙන්නේ කළු පාටින්."

"ඔව්... අවතාරයක් වගේ..."

ඊඩන් හිනාවුණා.

"විහිළු නෙමෙයි... බලන්නකෝ ඒ ළමයගේ මුහුණ දිහා"

ඊඩන් චිත්‍රය තව ටිකක් ළං කරලා බැලුවා. ඒ ළමයගේ ඇස් ඇඳලා තියෙන්නේ සුදු බෝල දෙකක් වගේ.

"සුදු බෝල දෙකක් වගේ, ඒ ළමයා අන්ධ කෙනෙක් වෙන්න බැරි ද ඊඩන්?"

"නැහැ මම හිතන්නේ ඒ ඇස් දෙකට වීදුරු බෝල අල්ලලා"

ඊඩන් එහෙම කියලා ආයෙමත් හිනාවුණා.

"විහිළු නෙමෙයි, මේ මෙයාව බලන්න මෙතැන දෙවැනියට ඉන්න ගැහැනු කෙනා.. එයාගේ බෙල්ලේ මොකක්ද එකක් තියෙනවා. හරියට කඹයක් වගේ"

"කෝ...?"

ඊඩන් ආයෙමත් චිත්‍රයට එබුණා.

"ඔව්... හැබැයි ඒක කඹයක් වෙන්න බැහැ, මාලයක්. ඒ ගැහැනු කෙනා බෙල්ලේ මාලයක් දාගෙන ඇති. ඒක තමයි පොඩි එකා ඔය බෙල්ලේ වැල දාගන්නවා වගේ බෙල්ල වටේ ඒක ඇඳලා තියෙන්නේ"

"නෑ... වෙන්න බැහැ. ඒක මාලයක් නම් කළු පාටින් පාට කරන්න විදියක් නැහැ. මාලයක් නම් ඒ දරුවා කළු නැතිව වෙන මොකක් හරි පාටකින් පාට කරන්න ඕනේ. නැහැ ඊඩන් මේ මාලයක් නෙමෙයි, කඹයක්... බෙල්ල වටේ දාලා තියෙන කඹයක්, මේ අන්තිමට ම ඉන්න අනිත් ගැහැනු කෙනාගේ බෙල්ලෙත් ඒ රවුම ම ඇඳලා තියෙනවා. අනික මේ පිරිමි කෙනා"

මම චිත්‍රය මගේ ඇස්වලට ළං කරලා බැලුවා. එතැන ඒ ළමයට එහා පැත්තේ ඉන්න ගැහැනු අය දෙන්නගෙ ම ඔළුවේ කළු පාට රවුම් දෙකක් තියෙනවා. ඒ දෙන්නට ම අතරමැද ඉන්නේ පිරිමි කෙනෙක්. එයාගේ ඔළුවේ පැත්තක් රතු පාටින් පාට කරලා.

"මොකක්ද මේ චිත්‍රය ඊඩන්. මට නම් තේරෙන්නෑ. බලන්න මේ පිරිමි කෙනාගේ ඔළුවේ පැත්තක් රතු පාටින් පාට කරලා"

මම ඒ දිහා බැලුවෙ පුදුමයකින්. ඒක මහා මූසල, අමුතු චිත්‍රයක්.

"මේක හරි ම අප්‍රසන්න චිත්‍රයක්"

ඒ මූසල හැඟීම නිසා ම මට තවත් ඒ දිහා බලන්න ඕනෙ වුණේ නැහැ. මම චිත්‍රය දෙකට නවලා එතැන ම ටීපෝව උඩින් තිබ්බා. තියලා ඊඩන්ට තුරුලු වෙලා ටීපෝව උඩ තිබුණ විදුලි ලාම්පුව නිවලා දැම්මා.

"කවුද ඒ චිත්‍රය ඇන්දේ කොල්ලෙක් ද?"

"නෑ... ගැහැනු දරුවෙක්. දියානා සොෆ් වයස අවුරුදු නවයක් විතර ඇති"

"හ්ම්, ගැහැනු ළමයෙක්... එහෙනම් ඒ ගැන වැඩිය හිතන්න එපා. ගැහැනු ළමයි තමයි ඔය පොඩි දේවල් ගැන ලොකුවට හිතන්නේ, ඔයා වගේ"

ඊඩන් මගේ නහයත් කොනිත්තලා, ලොකු හුස්මක් අරගෙන ඇස් පියාගත්තා. මමත් එයාට තුරුලු වෙලා නිදාගන්න උත්සහා කළා. ඒත් මගේ හිතට පේන්නෙ ම ඒ දරුවා ඇඳපු චිත්‍රය.

"නෑ වෙන්න බැහැ" මම මිමිනුවා.

"මොකක්ද?"

"ඒ චිත්‍රය... එයා ඒක අහම්බෙන් ඇඳපු එකක් වෙන්න බැහැ."

මගේ හිත ඒ චිත්‍රය යළි යළිත් මතක් කරමින් ඒ රූප අතරේ එහාට මෙහාට යනවා. මට දැනෙන්නේ හරි ම අප්‍රසන්න හැඟීමක්, මූසල නිරස ස්වභාවයක්. අනික ඒ චිත්‍රය දෙපාරක් ම කාමරයේ බිම වැටිලා තිබ්බා.

ඒක මතක් වෙද්දි මම ආයෙමත් ඇස් දෙක ඇරලා කාමරයේ දොර දිහා බැලුවා. කාමරයේ දොර තවමත් ඇරිලා නිසා කොරිඩෝව හොඳට පේනවා.

"ඊඩන් ඔය දොර වහලා දාන්න"

"මොන දොර ද?"

"අපේ කාමරයේ දොර... මට කොරිඩෝව පේනවා"

✶✶✶

එදා මුළු රාත්‍රිය ම මහ මූසල එකක්. මාව කිහිප වතාවක් ම බය වෙලා ඇහැරුණා. එක වතාවක් ඒ කාමරයේ දි දැකපු ගැහැනු කෙනාගේ රූපය නිසා. ඔව්... ඒ ගැහැනු කෙනෙක්. මට ඒක හොඳට විශ්වාසයි.

අනික, ඒ දරුවා ඇඳලා තිබුණ චිත්‍රයේ ඒ කළු පාට රූපය දැකලා. එදා රෑ මම දැකපු ගැහැනු කෙනයි, ඒ දරුවගේ චිත්‍රයේ ඉන්න කළු රූපයයි අතර මොකක් හරි සමානකමක් තියෙනවා. මගේ හිත මට මුමුනන්න ගත්තා.

"දෙවියනේ... ඒ චිත්‍රයේ හිටියෙත් ඒ ගැහැනු කෙනා ම ද?"

මගේ හිතේ තිබුණේ කුතුහලයක්.

"නැහැ වෙන්න බැහැ..."

එදා ඒ සිදුවීමෙන් පස්සේ මම ආයෙමත් මගේ ඔෆීස් කාමරයට ගියේ

නැහැ. පහුවෙනිදා උදේ ම ඔෆිස් කාමරයෙන් ගන්න ඕන ඒවා සේරම අරගෙන මම කාමරයට අගුලු දැම්මා.

අද - සඳුදා

අහස අන්ධකාරයි. ඊයේ රාත්‍රිය වගේ ම මහ මූසල හැඟීම් ගොඩක් තියෙන දවසක්. මම වාහනය පාරට හරවන ගමන් මගේ ගෙදර කුස්සිය දිහා බැලුවා. ඊඩන් ජනේලය ළඟ හිටගෙන කෝපි එක බොනවා. මම එයා දිහා බලද්දි එයා අත වනලා මට හාද්දක් දුන්නා. මමත් හිනාවෙලා 'ගිහින් එන්නම්' කියලා ඇස් දෙකෙන් සංඥාවක් කළා. ඒත් එක්ක ම මගේ ඇස් හැරුණේ කුස්සියට උඩින් තියෙන මගේ නිදන කාමරයේ ජනේලයට. මොකක් හරි හේතුවක් නිසා මම ටිකක් වෙලා ඒ දිහා බලාගෙන හිටියා.

මම මොකක් හරි දැක්කා...

නෑ... මගේ හිත මොකක් හරි කිවුවා. නෑ එහෙමත් වෙන්න බැහැ. නිදන කාමරය ළඟ ම තමයි ඔෆිස් කාමරයේ ජනේලය තියෙන්නේ. ඒක තිර රෙදිවලින් හොඳට වහලා තිබුණේ. මම ඒ දිහාත් බැලුවා.

"ඇයි...?"

මම දැක්කා ඊඩන් ඉඟියකින් වගේ අහනවා.

"නැහැ මුකුත් නැහැ"

මමත් ඉඟියක් කරලා කාර් එක පාරට ගත්තා. ඊයේ රාත්‍රියේ හරිහමන් නින්දන් නොලැබුණු නිසා ඔළුව බරයි. එක එක විකාර අදහස් ඔළුවට එනවා. ටිකක් නිදහස් වෙන්න ඕනේ. මම රේඩියෝව දැම්මා.

එක චැනල් එකක්... ඒකේ යන්නේ ක්ලැසික් මියුසික්. අනිත් එක... හ්ම්.. මේක හොඳයි. මේකේ සංවාදයක්... දෙන්නෙක් කතා කරනවා.

"රිචඩ්... ඔයා දන්නව ද ඇමෙරිකාවේ පැරණි චාරිත්‍රයක් තිබුණා කවුරු හරි මිය ගියා ම එයා පාවිච්චි කරපු හැම දේම එයා මිය ගිය දවසෙ ම පුච්චලා දානවා."

"ඔව්... ඇයි එයා මුහුණ බලපු කණ්ණාඩිය බිඳලා විසි කරන එක, එතකොට එයාගේ කාමරේ තියෙන ඔරලෝසුව කාමරෙන් ඉවත් කරන එක, දවස් කිහිපයක් යනකන් එයා ජීවත් වුණු කාමරයට කාටවත් යන්න නොදී කාමරය අගුලු දාන එක"

"අන්න හරි. මේ හැම දෙයක් ම කළේ ඒ මිය ගිය කෙනා ආයෙමත් ඒ

කාමරයට එන එක වළක්වන්න. මොකද ඉස්සර මිනිස්සු විශ්වාස කළා මිය ගිය කෙනා පාවිච්චි කරපු දේවල්, එයා ආස කළ ආභරණ, කොටින්ම එයා මුහුණ බලපු කණ්ණාඩිය, එයාගේ කාමරේ ඔරලෝසුව වගේ දේවල්වලින් පවා මළ ගිය අයට ආයෙමත් ඒ තැන්වලට පැමිණෙන්න පුළුවන් කියලා."

"ඔව්... මුහුණ බලන කණ්ණාඩිවලට නම් ඒ දේ විශේෂයෙන් කරන්න පුළුවන්. මොකද කෙනෙක් ජීවත්වෙලා ඉන්නකන් මුහුණ බලපු කණ්ණාඩියක් ඒ කෙනා මැරුණත් ඒ විදියට ම ඒ මුහුණ පරාවර්තනය කරනවා"

"ඒ කිවුවේ"

"ඒ කිවුවේ මැරුණු අයට පුළුවන් කණ්ණාඩි තුළ ජීවත් වෙන්න"

ඒක අහද්දි මගේ ඇඟ ටිකෙන් ටික සීතල වෙලා ගියා. මගේ ඇස් ඇරුණේ වාහනයේ උඩු දර්පනයට. ඒකට මගේ කාර් එකේ පිටුපස ආසනය පේනවා. මම ඇස් යවලා යාන්තමින් වගේ ඒ දිහා බැලුවා.

"මෙලින්ඩා"

මට ඇහුණා කවුරු හරි මගේ කනට ළං වෙනවා.

මගේ අත් වෙවුලුවා. ජනේලයෙන් ආපු සීතල හුළං පාරක් මගේ මුහුණ සීතල කරලා දැම්මා. මම කාර් එකේ වේගය අඩාල කරන ගමන් පිටුපස ආසනය දිහා හැරිලා බැලුවා.

"නැහැ කවුරුත් නැහැ"

ඒත් එක්ක ම රේඩියෝවේ හඬ ටිකෙන් ටික අඩු වෙලා ගියා. ඒකෙන් මතුවුණේ "ග් ර් ර් ර්" හඬක්. මම ඒ මොහොතෙ ම රේඩියෝව වහලා කාර් එක පාරේ අයිනට කරලා නැවැත්තුවා.

'නැහැ මේක වෙන්න බැහැ... ඊයේ දැකපු දේ නිසා මගේ ඔළුව විකාර වෙලා තියෙන්නේ. මම ඕනෑවට වඩා හිතනවා. අනික රේඩියෝවේ ගිය ඒ වැඩසටහන, ඒක අත්වැරැද්දක්, මට ඒක නොහා ඉන්න තිබුණේ. ඒක විකාරයක්, කණ්ණාඩියක් ඇතුළට කොහොමද මළගිය ආත්මයක් යන්නේ... මහ බොරුවක්'

මගේ මුහුණට ආවේ හිනාවක්. ඒක පපුවේ තිබුණු බයත් එක්ක ම ආපු හිනාවක් වෙන්න ඕනේ. ඒ හිනාවත් එක්ක ම මම අත් බෑගය විවර කරලා ඒකේ තිබුණු චිත්‍ර මිටිය අතට ගත්තා. චිත්‍ර විස්සක් විතර තිබුණු නිසා සේරම එකට රෝල් කරලා රබර් බෑන්ඩ් එකකින් හොඳට වහලා තිබුණේ. මම රබර් බෑන්ඩ් එකත් ඉවත් කරලා චිත්‍ර මිටියේ උඩින් ම තිබුණු චිත්‍රය දිහා බැලුවා.

මම ඒක කළේ ඇයි කියලා මමවත් දන්නෑ. පපුව සීතල වෙලා බයෙන් ඉන්න වෙලාවක, ඒ බයට හේතුවක් වුණු දෙයක් හිතාමතා ම කරන එකත් කොයි තරම් මෝඩ දෙයක් ද? සමහර විට කවුරු හරි මාව මෙහෙයවනවා

වෙන්න ඇති.

ඔව්... ඒ චිත්‍රය වෙනස්.

ඒ ළමයා කළුයි.. සමහර විට අප්‍රිකන් ළමයෙක් වෙන්න ඇති. කොණ්ඩෙත් කළු කුරු වගේ. ඔව්.. අප්‍රිකන් කෙනෙක් වෙන්න ඕනේ. මේ කෙල්ලගේ ගෙදර කළු සමක් තියෙන කෙනකුත් ජීවත්වෙනවා ඇති.

එහෙත් දියානා සුදු ළමයෙක්. ඒ ළමයගේ ගෙදරට කොහෙන්ද කළු කෙනෙක්. අනික ලේටන්වල කළු අය ඉන්නේ හරි ම අතළොස්සක්. සමහර විට ඒ ළමයගේ යහළුවෙක් වෙන්න ඇති.

ඔව් වෙන්න පුළුවන්.

(මගේ හිත මගෙත් එක්ක ම කියවනවා)

එතකොට ගැහැනු කෙනා. එයාගේ බෙල්ලේ තියෙන කඹය? නැහැ, ඒක කඹයක් නෙමෙයි. මාලයක්... ඔව් ඊඩන් හරි. ඒක මාලයක්.

මම නළල කසා ගත්තා. මගේ ඔළුව විකාර වෙලා. බොරු අදහස් ගොඩක් ඔළුවට ඇවිත් ඔළුව විකාරයක් කරලා. මම ගුරුවරියක්, මෙහෙම බොරුවට බය වෙන්න ඕන කෙනෙක් නෙමෙයි. මම ආයෙමත් චිත්‍ර මිටිය රවුම් කරලා ඒක රබර් බෑන්ඩ් එකෙන් තද කරලා බෑග් එකට ම දැම්මා.

මළගිය ආත්ම

පුංචි ළමයින්ට මළගිය ආත්ම පේනවා. ඔව්.. මම ඒක මුලින් ම විශ්වාස කළේ නැහැ. ඒත් ඒක විශ්වාස කළේ මගේ නංගිගේ දුව මුලින් ම මගේ ගෙදරට ආපු දවසේ. එදා මමයි ඊඩනුයි පදිංචි වෙලා හිටියේ දැන් ඉන්න ගෙදර නෙමෙයි. වෙන ගෙයක. අපි මුලින් ම මිලට ගත්තේ ෆමින්ග්ටන්වල අපේ අම්මලගේ ගෙවල් ළඟ ම තිබුණ පරණ ගෙයක්. එහෙත් මගේ නංගිත් එක්ක එයාගේ දුව අපේ ගෙදර ආපු දවසේ ඒ හැම දේම වෙනස් වුණා. ඒ මීට අවුරුද්දකට කලින්. එතකොට දුවගේ වයස අවුරුදු දෙකක්.

මමයි, නංගියි සෝෆා එකේ ඉඳගෙන කතා කරද්දි, දුව බිම ඉඳගෙන සෙල්ලං කරමින් හිටියේ. එයා ටික වෙලාවක් සෙල්ලං කරලා එකපාර ම සාලේ පැත්තකින් තියෙන කාමරේ දිහා බැලුවා.

(ඒ කාමරේ අපි ගබඩා කාමරේ විදියට පාවිච්චි කරපු එකක්. ඒ නිසා ඒක වහලා තිබුණේ)

දුව ඒ දිහා බලද්දි මම මුල දි ගණන් ගත්තේ නැහැ. ඒත් එයා සෙල්ලං කරන ගමන් විටින් විට ඒ දිහා බලද්දි මගේ හිතට සැකයක් ආවා. ඒ සැකය නිසා ම මම එයා දිහාට නැඹුරු වෙලා ඇහුවා "දුව මොනවද බලන්නේ කියලා." එතකොට එයා "ආච්චි... ආච්චි.." කියලා තොල් මතුරන්න ගත්තා.

එයා පුංචියි. ඒ නිසා මම හිතුවේ එයා වෙන මොකක් හරි දෙයක් හිතනවා ඇති කියලා. මම ආයෙමත් නංගිත් එක්ක කතාවට වැටුණා. ඒත් මගේ හිත තිබුණේ පොඩි කෙල්ල ළඟ.

එයා සෙල්ලං කරනවා. ඒ ගමන් සාලයේ පැත්තකින් තියෙන කාමරයේ දොර දිහාත් බලනවා. ඒ කාමරේ තිබුණේ අපි ඉඳගෙන හිටපු සෝපාවට පිටුපස්සට වෙන්න නිසා එයා ඇස් හරවලා බලද්දි මට එයාගේ ඇස් හොඳට පේනවා. ඒ ඇස්වල තියෙන්නේ අමුත්තක්. හරියට එයා කවුරු හරි මනුස්සයෙක් දිහා බලනවා වගේ. එයාගේ ඒ බැල්ම නිසා ම මමත් හැරිලා පිටිපස්ස බැලුවා. ඒ දොර වහලා තියෙන්නේ. කාමරයේ තියෙන්නෙත් පරණ බඩු විතරයි.

"ඇයි?"

මම ඒ පැත්ත හැරෙනවා දැකලා නංගිත් ඒ දිහා බැලුවා.

"නෑ... දුව අර කාමරය දිහා බලනවා... "

"නිකමට වෙන්න ඇති"

"නෑ... වෙන්න බැහැ... අර එයා බලන විදිය"

මම නංගිට දුවව පෙන්නුවා.

"එයා බලන්නේ කාව හරි දැකලා වගේ"

ඒක දකිද්දි නංගිගේ ඇස් දෙකත් ලොකු වුණා. එයා දෙවැනි පාරටත් හැරිලා දොර දිහා බැලුවා. හරියට මොකක් හරි දෙයක් උවමනාවෙන් ම දැකගන්න වගේ.

"ඔව්... ඔය බැල්ම මම දන්නවා."

නංගි එකපාර ම දුවලා ගිහින් පොඩි කෙල්ලව එයාගේ අතට ගත්තා. අරගෙන කෙල්ලව නළවන විදියට එයාගේ බැල්ම ඒ කාමරෙන් අයින් කරන්න හැදුවා. ඒත් නැහැ කෙල්ල ඒ පැත්ත ම හැරි හැරි බලනවා. මමත් සෝපාවෙන් නැඟිටලා නංගි ළඟට ගියා.

"ඇයි දුව මොනවද බලන්නේ?"

මම එයාගෙන් ඇහුවා. මොකක් හරි හේතුවකට නංගිගේ මුහුණේ තිබ්බේ බයක්.

"දන්නෑ... ඒත් මම මෙයාව දන්නවා. මෙයා මොකක් හරි දැකලා තියෙනවා"

එහෙම කියල නංගි එකපාරක් ආයෙමත් දොර දිහා බලලා, හොරෙන් වගේ මගේ කනට ළං වුණා.

"එයා මොකක් හරි දකිනවා"

මගේ පපුව සීතල වෙලා ගියා. මම ආයෙමත් ඒ කාමරය පැත්තට හැරුණේ නෑ.

"දුව... කවුද ඒ?"

මම එයාගෙන් ආයෙමත් ඇහුවා.

"ආච්චි"

පොඩි කෙල්ල එහෙම කියලා ඒ පැත්තට අත දිගු කළා හරියට කාව හරි අල්ලන්න වගේ.

එදා මගේ පපුවට දැනුණු ඒ බය නිසා ම, මම ඒ ගෙදර ජීවත් වෙන්න තියෙන ආසාවත් ඒ මොහොතෙ ම අතහැරලා දැම්මා. ඊඩන් ගෙදර ආව

ම එයාටත් ඒ ගැන කියලා, අපි තීරණය කළා ඒ ගෙය විකුණලා දාන්න. එතකොට තමයි අපිට දැනගන්න ලැබුණේ... 'ඒ ගෙදර මීට කලින් ජීවත් වෙලා තියෙන්නේ වයසක ගැහැනු කෙනෙක්. ඒ මනුස්සයා අවුරුදු ගාණක් ලෙඩින් ඉඳලා තියෙනවා. එයා මැරිලත් තියෙන්නේ මේ ගෙදරමයි. ඒ කාමරය ඒ ගැහැනු කෙනා ජීවත් වුණු කාමරය.

දියානාත් සමහර විට එහෙම මළගිය අයව පේන කෙනෙක් වෙන්න ඇති. මගේ මිනිබිරියගේ මතකයත් එක්ක දියානාව දකිද්දි මම කල්පනා කළේ ඒ සිදුවීම. දියානාත් මගේ මිනිබිරිය වගේ ම තඹ පැහැ කොණ්ඩයක්, රවුම් මුහුණක් සහ නිල් පාට ඇස් දෙකක් තියෙන හරි ම හුරුබුහුටි කෙල්ලෙක්. හැබැයි දියානාගේ මුහුණ හරි ම දුක්බර මුහුණක්. එයා සතුටින් ඉන්න වෙලාවක වුණත් එයාගේ මුහුණෙන් පේන්නේ එයා දුකින් ඉන්නවා වගේ. එයාගේ හැඟීම් මුහුණෙන් මතුවන ස්වභාවය හරි ම අඩුයි.

✳✳✳

මම පංතියට ආව හැටියෙ ම බැලුවේ දියානා දිහා. එයා පංතියෙ අන්තිමට ම තියෙන පුටුවක ඉඳගෙන ඉන්නවා. ඒ ඇස් රවුම්. තඹ කොණ්ඩෙට නිල් පාට රවුම් ඇස් එකතු වුණා ම හරි ම ලස්සනට පේනවා. එයාගේ මුහුණේ තියෙන ගුප්ත ස්වරූපය නිසා ම එයාව දකිද්දි මගේ හිතට ආවේ හරි ම අමුතු හැඟීමක්.

මම උදේ ම දරුවන්ට එයාලා ඇඳපු චිත්‍ර ගැන කිවුවා. හැමෝටම එයාලගේ චිත්‍රය බෙදලා දීලා ඒ අය ලකුණු දකිද්දි ඒ අයගේ මුහුණවල්වල ඇති වන වෙනස්කම දිහා බලාගෙන හිටියා. විශේෂයෙන් ම දියානාගේ. එහෙත් ඒ කෙල්ලගේ මුහුණේ එහෙම කියන්න තරම් ලොකු වෙනසක් ඇති වුණේ නෑ. එයා ටික වෙලාවක් චිත්‍රය දිහා බලාගෙන ඉඳලා එයාගේ ලොකු ඇස් දෙකින් මගේ දිහා බැලුවා. හරියට මට මොකක් හරි දෙයක් කියන්න වගේ.

මම එයා ළඟට ඇවිද්දා. එයාගේ චිත්‍රය අරගෙන බොරු හිනාවකුත් එක්ක ඒ දිහා හොඳට බලනවා වගේ රඟපෑවා. දියානාට අවුරුදු නවයක්. මේ වගේ වයසක දරුවෙක් එක්ක කතා කරද්දි ඒක බොහොම පරිස්සමින් කරන්න ඕනේ.

"දියානා ලස්සන චිත්‍රයක්නේ ඇඳලා තියෙන්නේ"

මම චිත්‍රය දිහා බලාගෙන බොරු හිනාවක් මවා ගත්තා.

"කවුද මේ ඔයාගේ පවුලේ අය ද?"

දියානා මගේ දිහා ඇස් ලොකු කරගෙන බලාගෙන ඉන්නවා. එයාගේ මුහුණේ කොහොමත් තියෙන්නේ දුක්බර ස්වභාවයක් නිසා එයා හිතන්නේ මොකක් ගැන ද කියලවත් හරියට කියන්න බැහැ.

"හ්ම්... හරි ම ලස්සනයි... කෝ මෙතැනින් දියානා?"

මම චිත්‍රය එයා ඉස්සරහා තිබ්බා.

දියානා එයාගේ ඇඟිල්ලක් චිත්‍රයේ මැද ම හිටිය ගැහැනු ළමයට ළං කළා.

"හ්ම්... ඔයා වගේ ම තමයි"

මම ඊළඟට චිත්‍රයේ දෙවැනියට හිටිය ගැහැනු කෙනාට ඇඟිල්ල තිබ්බා.

"එතකොට මේ?"

දියානා ඒ රූපය දිහා බැලුවේ බොහෝ ම ඕනකමින්. එයාගේ ඇස් ඒක දකිද්දි වෙනස් වුණා. හරියට එකපාර ම ඇස්වලට දුකක් ආරූඪ වෙනවා වගේ.

"අම්මා" ඇය මිමිනුවා.

"එතකොට මේ බෙල්ලේ.... මාලයක් ද?"

"නැහැ"

"එහෙනම්"

"කඹයක්"

"කඹයක්?"

"ඔව්..."

"කඹයක් මොකටද?"

"එල්ලන්න..."

"එල්ලන්න? ඇයි එල්ලන්නේ"

"මරන්න...."

මගේ පපුව වේගයෙන් වැඩ කරනවා. මම එකපාර ම බැලුවේ පන්තියේ ඉන්න අනිත් ළමයි දිහා. ඒ අයත් දියානාට ඇහුම්කන් දෙනවා. ඒත් මේක මෙහෙම හැමෝම ඉස්සරහා අහන්න ඕනේ දෙයක් නෙමෙයි.

"දුව එන්නකෝ මගෙත් එක්ක"

මම දියානාව එක්කගෙන මගේ මේසයට ගියා. ගිහින් අනිත් ළමයි දිහා බලලා,

"දැන් ඔය චිත්‍රයේ ඕගොල්ලෝ ඇඳපු 'පවුලේ අය' ගැන චිත්‍රය පිටුපස්සේ ලියන්න පටන් ගන්න. චිත්‍රයේ ඉන්න හැමෝම ගැන ලියන්න ඕනේ තේරුණා ද?"

මට ඕනෙ වුණේ දියානා එක්ක කතා කරන්න වෙලාව ගන්න. ඒ නිසා ම මම දරුවන්ට චිත්‍රය ගැන ලියන්න දීලා දියානාව මගේ ළඟට ළං කරගත්තා.

"දුව මොකක්ද ඒ කිවුවේ ඇයි අම්මගේ බෙල්ලේ කඹයක්?"

"මරන්න"

දියානා ආයෙමත් කිවුවා. මගේ හදවතට දැනුණේ පුදුමයක්. නෑ මේ දරුවා බොරුවක් නෙමෙයි මේ කියන්නේ, මේක ඇත්තක්. එයාගේ මුහුණෙන් ඒ තරම් හැඟිම් පේන්නේ නැති වුණාට එයාගේ ඇස් දෙකෙන් මට ඒක තේරෙනවා.

"ඇයි මරන්නේ?"

"දන්නෑ"

"දන්නෑ?"

"නැහැ"

එයා ඔළුව වැනුවා. ඒක මහ පුදුම උත්තරයක්. මම ඇඟිල්ලකින් නළලත් කසාගෙන ඒ චිත්‍රයේ ම 'දියානා ළඟින් ම හිටිය අනිත් කෙනාට ඇඟිල්ල තිබ්බා.'

"එතකොට මේ?"

දියානා ඒ දිහා බැලුවේ බයකින්. එයාගේ ඇස් ඒ රූපය දිහා ටික වෙලාවක් අමුත්තකින් වගේ බලාගෙන හිටියා.

"යහළුවෙක්"

"යහළුවෙක්.... ඒ කවුද?"

"දන්නෑ..."

"දන්නෑ?"

මම ආයෙමත් ඇහුවේ ඒකට උත්තරේ කොහොම හරි එයාගෙන් ගන්න ඕන නිසා.

"එතකොට දියානා දන්නෑ ඔයාගේ යහළුවගේ නම?"

"නැහැ. එයා මට එයාගේ නම කියන්නෑ..."

"හ්ම්, එතකොට එයා ඔයාගේ පවුලේ කෙනෙක් නෙමෙයි ද?"

"නැහැ"

"එහෙනම් දියානා එයාව පවුලේ චිත්‍රයට ඇන්දේ"

"එයත් ඉන්නේ අපේ ගෙදර නිසා"

මාව එකපාර ම ගොළු වුණා. ඒ දරුවගෙන් මොනවා අහන්න ද කියලවත් මට සිතුවිල්ලක් නැහැ. මගේ ඔළුව ගොඩක් කරුණුවලින් පිරිලා ගිහින්.

"එතකොට දියානා මෙයාව ඇයි කළු පාටින් පාට කළේ"

"එයා කළු පාට නිසා"

"කළු පාට... ඒ කියන්නේ"

මම ඔළුව හරවලා පන්තියේ දියානාගේ බංකු පේළියට ම එහා පැත්තේ ඉඳගෙන ඉන්න ලින්ටන් දිහා බැලුවා. ලින්ටන් සූඩාන් ජාතික දරුවෙක්.

"ඒ කියන්නේ ලින්ටන් වගේ"

මම ඒක ඇහුවේ දියානාට විතරක් ඇහෙන්න යාන්තමින් ඇයගේ කනට ළං වෙලා. දියානාත් හොරැහින් ලින්ටන් දිහා බලලා මගේ දිහා බැලුවා.

"නැහැ... ලින්ටන් වගේ නෙමෙයි. හැබැයි ලින්ටන්ට වඩා කළුයි. එයාගේ මුහුණේ දැලි තියෙනවා"

"දැලි?"

"ඔව් අඟුරු වගේ කළු පාට දැලි"

"හ්ම්"

මම මිමිනුවා. මගේ ඔළුවත් කැරකෙන්න වගේ. යුටාවල කළු ජාතීන් හරි ම අඩුයි. මගේ පංතියේ වුණත් ඉන්නේ එක ම දරුවෙක් විතරයි. ඒත් මේ කියන විදියට එයා කළු ළමයකුත් වෙන්න බැහැ.

මට මේ කිසිදෙයක් තේරෙන්නෑ. මට විතරක් නෙමෙයි ඒ දරුවටත් මේ කිසිදෙයක් නොතේරෙන ගානයි. එයා ඇස් දෙකත් ලොකු කරගෙන මගේ දිහා බලාගෙන ඉඳිද්දි, මමත් ටික වෙලාවක් එයා දිහා බලාගෙන කල්පනා කළා.

"එතකොට මේ ඇස්වල තියෙන වීදුරු බෝල දෙක"

"ඒ එයාගේ කණ්ණාඩි දෙක"

දියානා එහෙම කියලා පිටිපස්ස හැරිලා ලිලී දිහා බැලුවා. ලිලී ඇස් කණ්ණාඩි දෙකක් දාන තවත් පොඩි ගැහැනු ළමයෙක්.

"ලිලී වගේ"

දියානාගේ මුහුණින් මතුවුණේ පුංචි සිනහවක්. පව්, සමහර විට මේ දරුවා ඉන්නේ මොකක් හරි කම්පනයකින් වෙන්න ඇති. එහෙමත් නැත්නම්

දුකකින්. පොඩි අය එහෙම වේදනාවෙන් ඉදිද්දි ඒ අයගේ ඔළුවලට විවිධ අදහස් එනවා. මේ අඳින ඒවත් ඒ අදහස් නිසා මතුවෙන ඒවා වෙන්න පුළුවන්.

"හ්ම් දුව දැන් යන්න"

මම චිත්‍රය ආයෙමත් එයාගේ අතින් තිබ්බා.

"ගිහින් අනිත් අය වගේ ම ඔය චිත්‍රය පිටිපස්සේ ඔයා ඇඳලා තියෙන අය ගැන ලියන්න... හරි ද?"

"හරි ටීච"

දියානා ආයෙමත් එයාගේ මේසයට ගියා. මමත් පුටුවෙන් ඉඳගෙන එයා දිහා බලාගෙන හිටියා. මේ හැම දේම පටන් ගත්තේ මම පෙරේදා කාමරේ දී දැකපු ඒ ගැහැනු රූපෙත් එක්ක. ඒකත් මම හරියට ම දැක්ක එකක් කියලා කියන්න බැහැ. මගේ මනසේ ඇති වුණ ඡායාවක් වෙන්න ඇති.

ඒ දරුවා දිහා බලාගෙන ම මම මගේ හිතේ තියෙන මේ විකාර අදහස් විසිකරලා දාන්න උත්සහා කළා.

යක්ෂයා

'මිනිස්සුන්ට ජීවිතේ වැඩි කාලයක් ගනුදෙනු කරන්න වෙන්නේ දෙවියන් එක්ක නෙමෙයි යක්ෂයින් එක්ක. මේ දේ තේරුම් ගත්ත නම් මිනිස්සු ගොඩක් දුරට යක්ෂයින් එක්ක ගනුදෙනු කරන එක නවත්තලා දෙවියන් එක්ක ජීවත් වෙන්න උත්සහා කරයි.'

ආයේ ගෙදර එද්දි මගේ ඔළුව ඔය වගේ විකාර අදහස්වලින් පිරිලා ගිහින් තිබුණා. ගෙදරට ආව හැටිය ම මම කළේ නාන කාමරයට ගිහින් වතුරට ඔළුව අල්ලගෙන හිටිය එක. ඔළුවට සීතල වතුර වැටෙද්දි නිදහසක් දැනෙනවා. ඒත් ඒ ටික වෙලාවකට විතරයි. ඇඟත් පිහදගෙන කණ්ණාඩිය ළඟට ආව ම ඒ තිබුණු සැහැල්ලුව නිදහස ආයෙමත් ඈතට විසි වෙලා ගියා. මම කණ්ණාඩිය දිහා බලාගෙන ඉඳිද්දි මට මතක් වුණේ උදේ රේඩියෝවේ ගිය සංවාදය.

'කණ්ණාඩි තුළට මළගිය ආත්මවලට ඇතුල් වෙන්න ලේසියි'

ඒක මතක් වුණ හැටිය ම, මට කණ්ණාඩිය ඇතුළෙන් ඊයේ රෑ දැකපු ඒ රූපය පේන්න ගත්තා. ඒ ගැහැනු කෙනෙක්, ඔව් මට ඒක හොඳට ම විශ්වාසයි. අනික ඒ අර චිත්‍රයේ ඇඳලා තිබුණා වගේ පොඩි පිරිමි ළමයකුත් නෙමෙයි.

ඒක මතක් වෙද්දි මගේ ඇකුල් පණ නැතිව ගියා. මාව එතැන ම ඇදගෙන වැටුණා. මම ටික වෙලාවක් වැටුණු තැන ම ඉඳගෙන ඇඬුවා. කොහොමත් මගේ ඇකුල් පණ නැහැ කියලා මට දැනුණ ම මට ආයෙමත් නැඟිටින්න අමාරුයි. ඒ අදහස ඔළුවෙන් අයින් වෙනකන් ම මට එහෙම ම ඉන්න වෙනවා. මම ආයෙමත් නැඟිට්ටේ විනාඩි පහළොවකට විතර පස්සේ. මම තෙත තුවාය පිටින් ම මගේ කාමරයට ගිහින්, තුවාය විසිකරලා දාලා, නිරුවතින් ම ඇඳේ පොරෝනය යටට ගුළි වුණා.

'මට කිසිම දෙයක් දකින්න ඕන නැහැ. කිසිම දෙයක් හිතන්න ඕනෙත් නැහැ. මට ඕනේ නිදාගන්න.'

✳✳✳

මාව ආයෙමත් ඇහැරුණේ කවුරු හරි මගේ ඇඟට තුරුලු වෙනවා දැනෙද්දී. මම බය වෙලා කෑ ගහගෙන ඇඳෙන් නැඟිට්ටා.

"මෙලී... මෙලී... මොකද මේ?"

ඒ ඊඩන්. එයා ඔෆිස් ඇරිලා ඇවිත් ඒ ඇඳුම පිටින් ම මගේ ඇඟට තුරුලු වෙන්න ඇති.

"මම බය වුණා.. මම හිතුවේ"

"හිතුවේ, මොනවද හිතුවේ?"

"නැහැ.... මුකුත් නැහැ"

"නැත්තේ කොහේද ඔයා තවමත් හිතන්නේ ඊයේ රෑ සිදුවීම ගැන නේද?"

මම නිහඬ වුණා.

"මෙලී. මම ඔයාව හොඳට දන්නවා. ඔයාට මතකනේ මීට අවුරුද්දකට විතර කලිනුත් ඔයා ඔය වගේ ම පිස්සුවක් නටලා අපිට ගේත් වෙනස් කරන්න වුණා. ඔන්න මම ඔයාට දැන් ම කියනවා, මේ ගෙදරින් නම් යමු කියන්න එපා. මම මේ ගෙය හදන්න ම ලොකු ගාණක් යට කරලා තියෙන්නේ"

"නැහැ... එහෙම එකක් නෙමෙයි"

"එහෙනම්. එහෙනම් කොහොම එකක් ද? ඔයා නිරුවතින් නිදාගෙන ඉඳිද්දි මම හිතුවේ ඔයාට තුරුලු වෙලා ටික වෙලාවක් නිදාගන්න..."

"හ්ම්... මට සමාවෙන්න"

මම ආයෙමත් ඊඩන් දිහාවට හැරුණේ වේදනාවකින්.

"එන්න... අපි නිදාගමු"

මම එයාගේ අත අල්ලන්න උත්සහ කළා.

"නැහැ දැන් ඕනේ නැහැ, ඔයාගේ බෙරිහන් දීල්ල ට මගේ ඔළුවත් අවුල් වුණා."

ඊඩන් මගේ අතත් ගසා දාලා ඇඳෙන් නැඟිට්ටා.

"ඔයාට මොනවා වේගෙන එනව ද දන්නෑ. ඔය විකාර අදහස් ඔළුවේ ඔබාගෙන ඔයා තවත් දුර්වල වෙනවා"

"නැහැ මම දුර්වල නැහැ. ඒක නෙමෙයි... මට ඔයාට කියන්න දෙයක් තියෙනවා"

මම උත්සහ කළේ ඊඩන්ගේ හිතේ තියෙන කෝපය අඩු කරන්න.

"මොකක්ද, තවත් විකාරයක් ද?"

"නැහැ ඉඳගන්නකෝ, මේක මට ඔයාට කියන්න ම ඕනේ"

මම ඊඩන්ගේ අතින් ඇද්දා. එයා ආයෙමත් මගේ ළඟින් ඉඳගත්තා.

"මම අද දියානා සොෆ් එක්ක කතා කළා"

"කවුද, අර චිත්‍රය ඇඳපු ළමයා?"

"ඔව් ඒ ළමයා... "

"ඉතින්"

"ඒ ළමයා ඇඳලා තියෙන්නේ මාලයක් නෙමෙයි කඹයක්. ඒක ඒ ළමයා මට ස්ථිරව ම කිවුවා. අනික ඒ කළු පාටින් ඇඳලා තියෙන්නේ එයාගේ යහළුවෙක්ව"

"යහළුවෙක්?"

"ඔව්, ඒ අයත් එක්ක ඒ ගෙදර ම ජීවත් වෙන එක්කෙනෙක්"

"එතකොට ඇයි ඒ ළමයා කළු?"

"එයාගේ මුහුණේ දැලි තියෙනවලු"

"දැලි?"

"ඔව් දැලි" මම හිනාවුණා.

"හ්ම් එහෙනම් එයත් ඔයා වගේ ම මනස්ගාත හිතන කෙනෙක්"

ඊඩන් එතැනින් නැඟිට්ටා. එයා විතරක් නෙමෙයි කවුරුවත් ඒ දරුවා කියන දේවල් විශ්වාස කරන එකක් නැහැ. ඒත් මට හොඳට ම විශ්වාසයි දියානා ඒ කිවුවේ බොරුවක් වෙන්න බැහැ.

"හැබැයි ඒ ළමයා කියන්නේ ඇත්ත. ඒ කියපු කිසිදෙයක් බොරු නෙමෙයි"

"ඒ කියන්නේ ඔයත් ඒ විකාර විශ්වාස කරනවා"

"ඔව්..."

මම ඒක ස්ථිරව ම කිවුවා. ඊඩන්ට ඒකෙන් තරහා යන්න ඇති. එයා ටයිපටියත් බෙල්ලෙන් නිදහස් කරන ගමන් එතැනින් යන්න ගියා.

✶✶✶

අපි එතැනින් පස්සේ කතා කළේ නැහැ. එහෙත් ඒ ළමයගේ චිත්‍රය මගේ

ඔළුවෙන් අයින් කරන්නත් මට පුළුවන් වුණේ නැහැ. ඒ චිත්‍රයයි, රාත්‍රියේ දැකපු ඒ අවතාර රූපයයි එක්ක ම එදා මුළු දවස ම ගෙවිලා ගිහින් ඒ රාත්‍රියත් අනිත් දවස්වල රාත්‍රීන් වගේ ම මහ මූසල රාත්‍රියක් වුණා. එදා මම නිදාගත්තේ පුදුම බයකින්. හිතේ බය නිසා ම 'කොරිඩෝව නොපෙනෙන්නට' මම කාමරයේ දොර වහලා දැම්මා, මගේ ටීපෝවේ නිදන ලාම්පුවත් පත්තු කරල ම, ඊඩන්ට හොඳට ම තුරුලු වෙලා මගේ ඇස් දෙක වහගත්තා.

ඒ තරම් පරිස්සමට නිදාගෙනත් එදා රෑ මම දැක්කේ මහා කරුමක්කාර හීනයක්. මම ඒ හීනෙන් දැක්කේ දියානාගේ චිත්‍රයේ හිටිය ගැහැනු දෙන්නා. එක්කෙනෙක් වයසයි, අනිත් කෙනා තරුණ කෙනෙක්. ඒ දෙන්නා හිටගෙන හිටියේ නිවසක ජනේලයක් ළඟ තිබුණ ප්‍රමාණයෙන් විශාල මේසයක් ඉස්සරහා. ඒ වයසක ගැහැනු කෙනාගේ අතේ කඹයක් තිබුණා.

එයා කඹයත් අරගෙන මේසය උඩට නැග්ගා. නැඟලා කඹය පරාලයට විසි කරලා අනිත් කොන පහතට ඇදලා ගත්තා. ඒත් එක්ක ම පහත හිටිය තරුණ ගැහැනු කෙනා මේසය උඩින් පුටු දෙකක් තිබ්බා. ඒ නිවසේ වහල උසයි. ඒ නිසා ම වහලේ කොන් දෙකට යා කරලා සවි කරලා තිබුණ ලී කණුව තියෙන්නෙත් ටිකක් උඩට වෙන්න.

පුටු දෙක මේසය උඩින් තියලා දෙන්න ම පුටු දෙකට නැග්ගා. තරුණ ගැහැනු කෙනා කඹේ තොණ්ඩුව දාලා ඒක එයාගේ බෙල්ලට දාගත්තා. වයසක කෙනත් එහෙමයි. ඊට පස්සේ දෙන්නට දෙන්නා එකිනෙකාගේ මුහුණු දිහා බලාගෙන ටික වෙලාවක් හිටියා. දෙන්නගෙ ම මුහුණුවල තියෙන්නේ මහ අමුත්තක්. හරියට ඒ මුහුණු ඇතුලේ කිසිම ජීවයක් නැහැ වගේ.

දෙන්නා තොණ්ඩුවත් බෙල්ලට දාගෙන ටික වෙලාවක් එකිනෙකා දිහා බලාගෙන ඉඳලා එක්වර ම පුටු දෙක පැත්තකට තල්ලු කරලා දැම්මා.

එච්චරයි - දෙන්නගෙ ම බෙල්ල තොණ්ඩුවට හිර වුණා. දෙන්න ම දැඟලුවා. ගොඩක් වෙලා දැඟලුවා. වයසක ගැහැනු කෙනාගේ කකුල් හරහා මූත්‍රා පහ වුණා. ඒවා මේසයට වැටිලා මේසය දිගේ ගලාගෙන ගියා. ඒ මූත්‍රා නිසා ම ද දන්නෑ බෙල්ල හිරවෙද්දි ඒ ගැහැනු කෙනා එකපාර ම අවදි වුණා වගේ ලොකු හුස්මකුත් එක්ක කට විවර කළා. අත් දෙකෙන් කඹය අල්ලන්න වෙර දරමින් කෑ ගැහුවා.

උගුරෙන්... ඒ ශබ්දෙට වචන නැහැ. ඒක විලාපයක්, බෙරිහන් දීල්ලක්. උගුර පොඩි පට්ටම් වෙලා. හිරවෙලා යද්දි එන මූසල ගොරහැඩි සද්දයක්. ඒත් ඇය ඉදිරියේ සිටි අනිත් කෙනා ඒ වෙද්දිත් දෙතුන් පාරක් දඟලලා මැරිලා ගිහින්. ඇයගේ ඇස් ඇරිලා. ඒවා කෙවෙනිවලින් එළියට ඉලිප්පිලා.

වයසක කෙනාත් ඒ එළියට ඉලිප්පුණු ඇස් දිහා ම බලාගෙන දැඟලුවා.

ගොඩ වෙලාවක් දැඟලුවා. පණ ගිහින් මැරිලා යන මොහොතෙත්, එක් වරක් සංසුන් වෙලා ආයෙමත් දැඟලුවා. අන්තිමේ දී කටින් මොකක් ම හරි මුමුනමින් ඇය සම්පූර්ණයෙන් ම නිහඬ වුණා.

'දියානා'

මට ඇහුණේ ඒ නම. ඒ නමත් එක්ක ම මමත් කෑ ගැහුවා.

"දියානා"

මාවත් ආයේ ඇහැරුණේ මගේ කටින් නික්මුණු ඒ විලාපයත් එක්ක. නිකන් නෙමෙයි ඊඩන්වත් ඇහැරවගෙන. මගේ විලාපයෙන් බය වුණු ඊඩන් ඇඳෙන් බිමට පැන්නා.

"ඔයාට මොකක්ද වෙලා තියෙන්නේ. ඇයි විලාප දෙන්නේ?"

ඊඩන් විදුලි ලාම්පුවත් පත්තු කරලා මගේ දිහාට හැරුණා.

"මම හීනයක් දැක්කා"

"හීනයන් නෙමෙයි ඔයාට පිස්සු. ඔයාට යකෙක් වැහිලා, අර කාමරයට ගියා කියන යක්ෂයාව ඔයාට වැහිලා"

ඊඩන් හිතට ආපු කේන්තියත් එක්ක බැණගෙන බැණගෙන ගියා. හරි ම අමානුෂික විදියට. මම කවදාවත් දැකලා නැහැ ඊඩන් මේ තරම් කෝපවෙනවා.

ඔබව ඒ සඳහා තෝරගෙන අවසන්

අද අලුත් දවසක්. මම හැම අලුත් දවස ම පටන් ගන්නේ දෙවියන්ට ස්තුති කරලා. මම උදේ ම නැඟිටලා කණ්ණාඩිය ඉස්සරහට ගිහින් හිටගත්තා. දෙවියන්ව සිහිපත් කරගෙන මගේ මුහුණ දිහා බලාගෙන ම යාඥා කළා.

"දෙවියනේ මට තවත් අලුත් දවසක් ලබා දුන්නට ඔබ වහන්සේට ස්තුතියි"

මම හැමදාම දෙවියන්ට ස්තුති කරන්නේ මෙහෙම, කණ්ණාඩිය දිහා බලාගෙන. ඒ හැමදාක ම මට ඒක දැනෙන්නේ සාමාන්‍ය දෙයක් විදියට. ඒත් අද... අද කණ්ණාඩිය දිහා බලද්දි මගේ හිතට ආවේ බයක්. ඊයේ නාන කාමරේ දී දැක්කා වගේ ආයෙමත් කණ්ණාඩිය ඇතුළෙන් ඒ රූපෙ පෙනෙයි කියලා මම බය වුණා. ඒ නිසා ම කණ්ණාඩියෙන් පෙනෙන මගේ මුහුණ දිහාවත් නොබලා මම ඇස් වහගෙන දෙවියන්ට ස්තුති කළා. 'අද දවස නිස්කලංකව ගෙවන්න පුළුවන් ආශිර්වාදය මට ලබා දෙන්න' කියලා මම උන්වහන්සේගෙන් ඉල්ලුවා.

ඒත් එක්ක ම මට ඇහුණා මගේ ම හිත මට මොකක් ම හරි දෙයක් කොඳුරනවා.

"මෙලින්ඩා, දවස නිස්කලංක වෙන්න නම් ඔබ මේ යක්ෂයා එක්ක හැප්පෙන්න ම ඕනේ. ඔබව ඒ වෙනුවෙන් තෝරගෙන අවසන්."

මම කණ්ණාඩියෙන් අඩියක් පස්සට තිබ්බා. මට ඒක දැනුණේ ස්වර්ග යෙන් ආ පණිවිඩයක් විදියට. හරියට දෙවියන් වහන්සේ මට අණ කරනවා වගේ.

'ඔබ ඒ දේ කරන්න ම ඕනේ. ඔබව ඒ සඳහා තෝරගෙන අවසන්'

දෙවියන් යක්ෂයින් එක්ක සටන් කරන්න උන්වහන්සේගේ දේවදූතයින් වෙනුවට මිනිස්සුන්ව තෝරගන්නවා.

මම ජීවත් වෙන්නේ ඇමෙරිකාවේ ඌටා ප්‍රාන්තයේ, ලේටන් කියන පුංචි නගරයේ. මේ නගරය දැවැන්ත කඳු පංතියකින් වට වුණු හරි ම ලස්සන පුංචි නගරයක්. මම උගන්වපු 'බ්‍රිඩ්ජ්වේ' ප්‍රාථමික පාසැල පිහිටා තිබෙන්නේ මගේ නිවසේ ඉඳන් විනාඩි පහළොවක් විතර දුරින්. ඒ පාසැල ආසන්නයේමයි සෙන්ට් මාක් දේවස්ථානය තියෙන්නෙත්. මම තීරණය කළා